**ශීර්ෂය 301 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 01දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝම්බර් 20 දින ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැතිඅංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනටසමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර,මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හදුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා  අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා  දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දෙපාර්තමේන්තුවේඅභ්‍යන්තර පාලනයේ  සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත්කරුණුපිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විගණන පනතේ 6 (1) (ඈ) වගන්තියහා 38 වගන්තියප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණකාධිකාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඉදිරිපත් කළ යුතු රු.1,014,769 ක්වූ වත්කම් මිලදී ගැනීම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. | රු.1,014,769 ක්වූ වත්කම් මිලදී ගැනීම් වැරදීමකින් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **දෙපාර්තමේන්තුවේඅදහස් දැක්වීම** |
| --- | --- | --- | --- |
| 2019 ජුනි 17 දිනැති අංක 04/2019 හා 2019සැප්තැම්බර් 24 දිනැති අංක 05/2019 දරන අයවැය චක්‍රලේඛ | 2019 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වලින් සියයට 25 ක් ඉතිරි කළ යුතු වුවද ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශය සහ අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ පැවැති සාකච්ඡාවේදී එකඟ වූ පරිදි අදාල වැය විෂයන් වල ප්‍රතිපාදන අවුරා තැබීමක් සිදු නොකර තිබුණි.එබැවින් මූල ධන වියදම් වලින් සියයට 25 ක ඉතිරි කිරීමක් අවශ්‍ය නොවුණි. |

**2.** **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**2.1** **සැලැසුම් කිරීම**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය යටතේ වන සමුපකාර සමිතිවලින් සමිති 27 ක මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම වර්ෂ 01 ක සිට වර්ෂ 05 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. තවද, සමිති 10 ක ලියාපදිංචි වර්ෂයෙන් පසුව එලඹෙන ගිණුම් වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සමුපකාර සමිති පනත අනුව අදාල මුදල් වර්ෂය අවසන් වී මාස 03 ක් ඇතුලත රෙජිස්ට්‍රාර්වරයා වෙත ගිණුම් ඉදිරිපත් කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම වර්ෂ 02ක් ප්‍රමාදවූ සමුපකාර සමිති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපි යොමු කර ඇත. අදාල සමිති 10 න් 04 ක් අක්‍රීය සමිති වේ. එක් සමිතියක් වෙනත් නමකින් ලියාපදිංචි කර ඇත.තවත් සමුපකාර සමිතියක් වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපි යොමු කර ඇත. අනෙක් සමිති සම්බන්ධයෙන් එම සමිති නිලධාරීන් දැනුවත් කර ඇත. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය යටතේ වන සමුපකාර සමිති 68 න් 2020 අගෝස්තු 31 වන විට 2019 වර්ෂයේ ගිණුම් විගණනය සිදු කර තිබුණේ සමිති 10 ක පමණි. එම සමුපකාර සමිති 10 න් විගණන වාර්තා මුදාහැර තිබුණේ සමිති 03 කට පමණි. | පනත ප්‍රකාරව සෑම ලියාපදිංචි සමිතියක්ම වර්ෂයකට වරක් රෙජිස්ට්‍රාර් විසින් විගණනය කිරීම සිදු කළ යුතු අතර විගණනයෙන් හෙළිවන අඩුපාඩු රෙජිස්ට්‍රාර්වරයා විසින් සමිතියේ දැනගැනීමට යොමු කිරීම කඩිනම් කළ යුතුය. | ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ නිවැරදි බවට පිළිගනිමි.<br>2020.08.31 වන විට සමුපකාර සමිති 30ක් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර, සී/ස සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමයේ මූල්‍ය ප්‍රකාශන අඩුපාඩු සහිත බැවින්, ඒ බව සමිතිය වෙත දැනුම් දෙන ලදී. සමුපකාර සමිති සංගම් 27 ක් විගණනය සඳහා බලය පවරා ඇති අතර, කොරෝනා වසංගතය හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සහ සමිතිවල නිලධාරීන් රාජකාරි සඳහා වාර්තා නොකල බැවින් මෙම ප්‍රමාදයන් සිදු වූ බවට කාරුණිකව දන්වමි. |

## 2.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2013 අප්‍රේල් 26 දිනැති අංක අමප/13/0409/540/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සමුපකාර ග්‍රාමීය බැංකු, ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, සණස සංගම් සහ වෙනත් මූල්‍ය සමුපකාර සමිතිවල කටයුතු නියාමනය කිරීම පිණිස විශේෂිත නියාමන ඒකකයක් පිහිටුවිය යුතු බවට තීරණය කර තිබුණි. ඒ අනුව පිහිටුවනු ලැබූ නියාමන ඒකකයේ කටයුතු සඳහා 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.20,997,850 ක් වැය කර තිබුණි. එම ඒකකය ආරම්භ කර වසර 07 ක් ගත වුවදමෙම නියාමන කටයුතු සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක වී නොතිබුණි. | නියාමන කටයුතු සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක විය යුතුය. | 2013 වර්ෂයේ සිට බැංකු නියාමන ජාතික ඒකකය මඟින් මූල්‍ය සේවා සමිති සංවර්ධනය හා නියාමනය සඳහා වන කටයුතු විධිමත් ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කෙරුණි. එහෙත් මුල් කාලයේ කාර්යය මණ්ඩලයේ 8 දෙනෙකුගෙන් යුක්ත වූ ජාතික නියාමන ඒකකයට දිවයින පුරා පිහිටි 8000කට අධික මූල්‍ය සේවා සමුපකාර සමිති නියාමනය, සමිති මට්ටමින් සිදු කිරීම සහ ඊට අදාල පසු විපරම් කටයුතු විධිමත් පරිදි කරගෙන යාම අපහසු විය. |
| (ආ) | සමුපකාර ග්‍රාමීය බැංකු සහ අනෙකුත් මූල්‍ය සේවා සපයන සමුපකාර සමිති නියාමන කටයුතු විධිමත් කිරීම සම්බන්ධයෙන් පනතක් කෙටුම්පත් කිරීම 2019 වර්ෂයේ සිට ආරම්භ කර තිබූ අතර තවදුරටත් එය කෙටුම්පත් මට්ටමේම පැවතුන අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදීරු.1,344,871 ක වියදමක් දරා තිබුණි. | පනත සැකසීමේ කටයුතු කඩිනම් කිරීම. | සකස් කරන ලද පනත් කෙටුම්පත 2020.09.28 වන දින සමුපකාර සේවා, අළෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාර දෙනු ලැබීය. මෙම පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා කමිටු රැස්වීම් පැවැත්වීමට හා දීමනා ගෙවීමටත්, පනත් කෙටුම්පත සඳහා මහජන අදහස් ලබා ගැනීමට පුවත්පත් දැන්වීම් පළ කිරීමටත්, නියාමන සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීමටත්, ගිණුම්කරණ අත්පොත සකස් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීමටත් සහ 2019.09.16 දිනැති නියාමන කමිටුව පැවැත්වීමත් ආදී වශයෙන් 2019 වර්ෂයේ දී මූලධන වැය හා සමුපකාර සංවර්ධන අරමුදල් වැය යටතේ නියාමන කටයුතු සඳහා වියදම් දරා ඇත. |

## 2.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.මිලියන 170 ක වටිනාකමක් සහිත තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිය **(INFO COOP )** 2017 අගෝස්තු ආරම්භ කර තිබු අතර ප්‍රසම්පාදන සැලැස්මට අනුව මෙම ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් වන විට අවසන් කිරීමට නියමිත තිබුණි. එසේ වුවද විගණිත දිනය වන විටත් එම ව්‍යාපෘතියේ කටයුතු අවසන්ව නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතුවල ප්‍රමාදය සහ උපදේශක ආයතනයට කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර පුරප්පාඩු පැවතීම, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙන් ව්‍යාපෘතියට අනුමැතිය ලැබීම ප්‍රමාදවීම හා පිරිවැය අනුමැතිය ලැබී නොතිබීම ව්‍යාපෘතිය ප්‍රමාද වීමට හේතුවිය. |
| (ආ) | ජාත්‍යන්තර සමුපකාර දින උත්සව වියදම් සඳහා සමුපකාර සංවර්ධන අරමුදලෙන් රු.16,146,654 ක් වැයකර තිබුණි. මෙම මුදලින් රු.9,096,553 ක් දරා තිබුණේ සංග්‍රහ, නවාතැන්,ඉන්ධන, මුද්‍රණ හා විවිධ වියදම් සඳහාය. රු.4,400,000 ක් පාසැල් ළමුන් සඳහා පාසැල් බෑග් ලබා දීම සඳහාද රු.1,263,712 ක් පුවත්පත් දැන්වීම් සඳහාද වැයකර තිබුණි. එසේ වුවද සමුපකාර ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා වැයකර තිබුණේ රු.1,500,000 ක වියදමක් පමණක් වූ අතර එය සමුපකාර දින වියදම්වලින් සියයට 09 ක් වූ අවම අගයක්ව පැවතුනි. | ජාත්‍යන්තර සමුපකාර දින උත්සවය සැමරීමේදී වියදම් දැරීමේ ප්‍රවණතාවය සමුපකාර ක්ෂේත්‍රයේ දියුණුව සඳහා විය යුතුය. | සංග්‍රහ නවාතැන් ආදී වියදම් සඳහා වැඩි වැයක් දැරීමට සිදුවී ඇත්තේ සංවිධාන කටයුතු වල නිරතවන අය සඳහා නවාතැන් ආහාරපාන හා දීපව්‍යාප්තව මේ සඳහා සහභාගීවන අය වෙත ආහාරපාන ලබාදීමට සිදුවීමත් නිසාය. මෙම උත්සවය සඳහා සමුපකාර අරමුදලින් දරන ලද වියදම රු. 11,746,654.00 ක් වන අතර 2018 වර්ෂයේ 96 වන ජාත්‍යන්තර සමුපකාර දින උත්සවයට සමගාමීව පාසැල් ළමුන් සඳහා බෑග් ලබාදීම සිදුකරන ලදී. ඒ වෙනුවෙන් මහජන බැංකුව වෙතින් අමාත්‍යාංශය හරහාරු.4,400,000.00 ක අනුග්‍රහකත්වයක් ලබාදී තිබුණි. මේ සඳහා වියදම් දරන ලද්දේ 2019 වර්ෂයේදීය. |